සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**දේශපාලන විද්‍යාව I**

**Political science I**

23 | S | I

පැය 02

**Time:02 hours**

**සැලකිය යුතුයි**

- **මෙම ප්‍රශ්න පත්‍රය A** සහ **B** යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- **A** කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ **B** කොටස කෙටි ප්‍රශ්න 20කින් යුක්ත වේ.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතු ය.
- එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 100 කි.

- **අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න**

01 දේශපාලනය,

1 න්‍යායාත්මකව දේශපාලන සංකල්ප හදාරනු ලබයි.
2 රාජ්‍ය හා රාජ්‍ය පරිපාලනය අධ්‍යයනයට ලක් කරයි.
3 දේශපාලනය ශාස්ත්‍රීය අධ්‍යයනයක් ලෙස පිළිගනු ලබයි.
4 සදාචාරාත්මක දේශපාලනය ආණ්ඩුව හා බද්ධ කරගනු ලබයි.
5 දේශපාලනයට පුරවැසියන්ගේ සහභාගිත්වය යන්න මෙහි අර්ථය වේ. (............)

02 දේශපාලනය යනු,

1 ආණ්ඩුකරණයට පමණක් අදාළ වූ සංකල්පයකි.
2 මැතිවරණ ක්‍රියාවලියට පමණක් සීමාවේ.
3 රාජ්‍ය පරිපාලනයට පමණක් සීමා වී ඇත.
4 රාජ්‍ය හා පුරවැසියන් අතර පවතින බල සම්බන්ධතාවයයි.
5 දේශපාලන විද්‍යාවේ න්‍යායාත්මක පදනම වේ. (............)

03 දේශපාලන විද්‍යාව

1 ආත්මීය ජීවිතය පදනම් කරගත් ප්‍රායෝගික භාවිතයකි.
2 ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් මෙහි ආරම්භක සාමාජිකයන් වේ.
3 කෙටි ඉතිහාසයකට හිමිකම් ඇති විෂයකි.
4 අධ්‍යයනය සඳහා ශුද්ධ විද්‍යාත්මක ප්‍රවේශ යොදා ගනු ලබයි.
5 රාජ්‍ය හා බලය පදනම් කර ගනිමින් පටු අධ්‍යයනයකට සීමා වේ. (............)

04 දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශය,

1 දාර්ශනික ප්‍රවේශය දේශපාලනයෙහි ප්‍රතිමානීය අරමුණ ගැන දැඩි උනන්දුවක් දක්වයි.
2 තුලනාත්මක ප්‍රවේශය තුළ වාස්තවික බව දැනගත හැකිය.
3 බහු විෂයක ප්‍රවේශය තුළින් දේශපාලන ගැටළු සංසන්දනාත්මකව අධ්‍යයනය කරයි.
4 විද්‍යාත්මක චර්යාවාදී ප්‍රවේශය මාක්ස්වාදී න්‍යාය මත රඳා පවතී.
5 ස්ත්‍රීවාදී ප්‍රවේශය තුළ ඓතිහාසික භෞතිකවාදය පිළිබඳ සාකච්ඡා කරයි. (............)

05 "දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 දාර්ශනික ප්‍රතිමානී ප්‍රවේශය මෑත කාලීනව දේශපාලන විද්‍යාව අධ්‍යයනයට යොදා ගන්නා ලදී.
2 තුලනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය තුල ධාරාවන් තුනක් පවතී.
3 බහු විෂයක ප්‍රවේශයෙන් දේශපාලන විද්‍යාව හුදකලා වූ විෂයක් බව පෙන්වා දෙයි.
4 විද්‍යාත්මක චර්යාවාදී ප්‍රවේශය තුළ දේශපාලන විද්‍යාව උපකල්පනයන් මත අධ්‍යයනය කරයි.
5 ස්ත්‍රීවාදී අධ්‍යයන ප්‍රවේශය මගින් පුරුෂ කේන්ද්‍රීය සමාජීය හා දේශපාලන පැතිකඩ අගය කරයි. (............)

06 දේශපාලන පක්ෂ,

1 ඍජු ප්‍රජාතන්ත්‍රවාදය මගින් නිර්මාණය කරන ලදී.
2 ඉතා දීර්ඝවූ ඉතිහාසයක් දක්නට ලැබේ.
3 ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයට නැතිවම බැරි අංගයකි.
4 දේශපාලන පක්ෂ වර්ගීකරණය කළ නොහැක.
5 කිසිවවිටක ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු නොකරයි. (............)

07 " දේශපාලන පක්ෂ " සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 මැතිවරණ හෝ වෙනත් මාධ්‍යයන් හෝ මගින් ආණ්ඩු බලය ලබා ගැනීම එහි මුඛ්‍ය අරමුණ වේ.
2 දේශපාලන පක්ෂවලට දීර්ඝ ඉතිහාසයක් ඇත.
3 නිශ්චිතවම හඳුනාගත් ප්‍රතිපත්ති රාමුවකින් තොරව කටයුතු කරයි.
4 දේශපාලන පක්ෂ වර්ගීකරණයකට ලක් නොකරයි.
5 දේශපාලන නායකත්වයන් ගොඩ නැංවීම ප්‍රතික්ෂේප කරයි. (............)

08 "සිවිල් සමාජය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල පමණක් පුළුල් දේශපාලන අභිලාෂ කරන බහුජන ව්‍යාපෘතියකි.
2 දේශපාලන පක්ෂ හා සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වේ.
3 විපක්ෂයට දේශපාලන බලය ලබාදීම සඳහා ක්‍රියාත්මක වේ.
4 නිශ්චිත මතවාද හා ක්‍රියාමාර්ග වලින් තොරව කටයුතු කරයි.
5 පුළුල් බහුජන කොටස් ඍජු දේශපාලන ක්‍රියාකාරිත්වය යොමු කිරීම ඒවායේ විශේෂත්වයයි. (............)

09 "රාජ්‍ය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 රාජ්‍ය දේශසීමා වලින් තොරව ඕනෑම ස්ථානයක සිට ක්‍රියාත්මක වේ.

2 එය සමාජය නොව ආණ්ඩුව විසින් නිර්මාණය කරන ලද්දකි.

3 එය ඓතිහාසික වශයෙන් සුවිශේෂ වූ නිර්මාණයකි.

4 එහි බලය අසහාය නොවේ.

5 එහි කාර්ය භාරය නීතිය හා සාමය සුරැකීමට පමණක් සීමා වේ. (............)

10 රාජ්‍ය හා ආණ්ඩුව,

1 ආණ්ඩුවට දිගු ඉතිහාසයක් තිබුණද රාජ්‍යයට එසේ නැත.

2 රාජ්‍යය නිශ්චිත අතර ආණ්ඩුව ගතික වේ.

3 ආණ්ඩුව දේශ සීමාව අතින් පළල් වන අතර රාජ්‍ය පටුය.

4 ආණ්ඩුවේ ප්‍රායෝගික හස්තය රාජ්‍ය වේ.

5 රාජ්‍යය විවේචනය කළ හැකි වුවද ආණ්ඩුව විවේචනය කළ නොහැක. (............)

11 " ආණ්ඩුව" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 නොවෙනස්ව පවතිනු ලබන බල ව්‍යුහයකි.

2 රාජ්‍යයෙන් වෙන්වූ ආයතනයකි.

3 විධායකයෙන් තොරව පවත්වාගෙන යනු ලබන ආයතනයකි.

4 උත්තරීතර බලය හිමි එකම ආයතනය වෙයි.

5 ජනතාව විසින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක සීමිත කාලයකට පමණක් තෝරා ගනු ලබයි. (............)

12 ඒකීය ආණ්ඩු ක්‍රමයට අදාළ නොවන්නේ,

1 විශාල භූගෝලීය හා වාර්ගික බෙදීම්වලින් යුක්ත වූ රාජ්‍යයන්ට වඩාත් උචිත වේ.

2 රාජ්‍යයේ ස්වාධිපත්‍ය මුළුමනින්ම රැඳී ඇත්තේ මධ්‍යම ආණ්ඩුව වෙත ය.

3 මධ්‍යම ආණ්ඩුවට පළාත් පාලන ආයතනවලට විමධ්‍යගත කර ඇති බලතල ඕනෑම අවස්ථාවක ආපසු ලබාගත හැකිය.

4 ඉතා කාර්යක්ෂම ආණ්ඩු ක්‍රමයක් ලෙස හඳුන්වයි.

5 පාර්ලිමේන්තු පනතක් මගින් බලය විමධ්‍යගත කොට ඇත. (............)

13 සංඝීය ආණ්ඩු ක්‍රමයක දක්නට නොලැබෙන ලක්ෂණය,

1 ව්‍යවස්ථානුකූලව දේශපාලන හඬක් ප්‍රාදේශීය හා පළාත් අභිලාෂයන්ට ලබාදීමට හැකි වේ.

2 මධ්‍යම ආණ්ඩු හා ප්‍රාන්ත ආණ්ඩු අතර අන්තර් සම්බන්ධතාවය ගොඩනැගීමට හැකිවීම.

3 ආණ්ඩු බලය විමධ්‍යගතව විසිරීම හේතුවෙන් පුද්ගල නිදහස ආරක්ෂා වීම.

4 භින්න වූ සමාජයන් එක්සත්ව හා ඒකාබද්ධව තබා ගැනීමට හැකි වීම.

5 කාර්යක්ෂම භාවය හා ශක්තිමත් භාවය වර්ධනය වීම. (............)

14 "ජනාධිපති ආණ්ඩු ක්‍රමය" සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1 ව්‍යවස්ථාදායකය තුලින් විධායකය තේරී පත් වේ.

2 ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වගකිව යුතුය.

3 රාජ්‍ය නායක භූමිකාව හා ආණ්ඩුවේ නායකයා ලෙස ජනාධිපතිවරයා කටයුතු කරනු ඇත.

4 විධායකය හා ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයෙන් හා අධිකරණයෙන් සම්පූර්ණයෙන් ඉවත් කොට ඇත.

5 ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයට ද වගකීමට බැඳී සිටිය යුතුයි. (............)

15 පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයට අදාළ නොවන්නේ,

1 අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය සාමූහික ලෙසින් ව්‍යවස්ථාදායකයට වග කියයි.

2 විධායකය ව්‍යවස්ථාදායකය තුළින් උපත ලබයි.

3 රාජ්‍ය නායකයා ඍජු ලෙසින්ම තෝරා පත් කර ගනු ලබයි.

4 පාර්ලිමේන්තුවේ සහය මත ආණ්ඩුව රඳා පවතී.

5 සත්‍ය විධායකයේ උපදෙස් මත නාමික විධායකය කටයුතු කරයි. (............)

16 මාක්ස්වාදයට අනුව රාජ්‍යය,

1 පංති ගැටුමෙහි ප්‍රතිඵලයක් වේ.

2 සුබ සාධන සංවිධානයක් වේ.

3 සෑම කල්හිම පැවති පවතින සංවිධානයක් වේ.

4 මානව යහපත සඳහා අත්‍යාවශ්‍ය සංවිධානයක් වේ.

5 සියළු සමාජ පංතීන්ට සමානව සේවය කරන්නක් වේ. (............)

17 පශ්චාත් යටත් විජිත රාජ්‍යය,

1 යටත් විජිත දේශපාලන සහ ආර්ථික ව්‍යුහයන්ගෙන් කැඩී වෙන්වී ඇත.

2 ශක්තිමත් සිවිල් හා මිලිටරි නිලධාරී තන්ත්‍රයකින් සමන්විතය.

3 සිවිල් සමාජය ශක්තිමත්ය.

4 ජාතික ඒකාග්‍රතාවය ද ගොඩ නගාගෙන ඇත.

5 ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තන සාර්ථකව අත්පත් කරගෙන ඇත. (............)

18 රාජ්‍යය පිළිබඳ ලිබරල්වාදී න්‍යාය,

1 කාල්මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස්ගේ අදහස් වලින් පෝෂණය වී ඇත.

2 වෙළඳපොළ ආර්ථික ක්‍රමයට විකල්ප ආර්ථික ක්‍රමයක් යෝජනා කරනු ලබයි.

3 පෞද්ගලික නිදහස පොදු යහපත වෙනුවෙන් කැපකළ යුතු බව අවධාරණය කරයි.

4 පශ්චාත් සම්භව්‍ය ලිබරල්වාදය සුබසාධන රාජ්‍ය සංකල්පය මත පදනම් වී ඇත.

5 නව ලිබරල්වාදයේ මූලික හරය රාජ්‍ය පාලිත ආර්ථිකයක් වෙනුවෙන් පෙනී සිටීමයි. (............)

19 මිශ්‍ර ආණ්ඩු ක්‍රමය හෙවත් අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයක් වන්නේ,

1 ජනාධිපතිවරයා නාම මාත්‍රික වීමයි.

2 ද්විත්ව විධායකයක පැවැත්මයි.

3 පැහැදිළි බලතල බෙදා වෙන් කිරීමක් දැකිය හැකිවීමයි.

4 නිල කාලය අවසන් වන තුරු ජනාධිපතිවරයා ඉවත් කිරීමේ ව්‍යවස්ථානුකූල ක්‍රම වේදයක් නොමැති වීමයි.

5 ව්‍යවස්ථාදායකය එක් මාණ්ඩලික ආයතනයක් වීම අනිවාර්ය ලක්ෂණයක් වීමයි. (............)

20 සමූහාණ්ඩුවාදයට නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1 රාජාණ්ඩු වාදයට එකහෙලා විරුද්ධය.

2 ඇරිස්ටෝටල්, පොලිබියස්, සිසරෝ සම්භව්‍යය සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන ප්‍රකාශකයෝය.

3 දහඅට වැනි සියවසෙන් පසු වර්ධනය වූ එක් මූලධර්මයක් වන්නේ පාලකයා ජනතාව විසින් පත් කළ යුතු බවයි.

4 දේශපාලන ප්‍රජාවක් ලෙස සංවිධානය වීමේ මූලික අරමුණ වන්නේ පුරවැසි යහපත ළඟා කර ගැනීමයි.

5 නිශ්ක්‍රීය පුරවැසියා පිළිබඳ සංකල්පය එහි එක් මූලික හරයයි. (............)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ මගින් සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම,

A- සාමාන්‍ය ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගන්වන ලදී.

B- නිර්බාධවාදී රාජ්‍යය ප්‍රතිපත්තිය ශක්තිමත් කරන ලදී.

C- ආණ්ඩුකාරවරයාගේ බලය වැඩිවීමට බලපාන ලදී.

D- දේශපාලන පක්ෂ බිහිවීමට අවශ්‍ය පසුබිම සකස් කරන ලදී.

E- ප්‍රභූ ජනතාව සහ නිර්ප්‍රභූ ජනතාව අතර පැවති සුවිශාල පරතරය අවම කරන ලදී.

1) A B C 2) A B D 3) A D E 4) A B C D 5) B C D E (............)

22 1931 දී හඳුන්වා දෙන ලද ව්‍යවස්ථාදායකය,

A- රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හඳුන්වන ලදී.

B- සාමාජිකයින් 61 දෙනෙකුගෙන් සමන්විත විය.

C- නීති සම්පාදනය සම්බන්ධයෙන් උත්තරීතර බලයක් හිමි විය.

D- විශ්වාසභංග යෝජනාවක් සම්මත කිරීම මගින් ආණ්ඩුකාරවරයා බලයෙන් ඉවත් කළ හැකි විය.

E- නිල කාලය අවසන් වන තුරු විසුරුවා හැරිය නොහැකි විය.

1) A හා B ය. 2) A හා D ය. 3) B හා C ය. 4) B හා E ය. 5) A B හා D ය. (............)

23 1931 දි හඳුන්වා දෙන ලද විධායක කාරක සභා ක්‍රමය,

A- කථානායක සහ රාජ්‍ය නිලධාරින් හැර ඉතිරි රාජ්‍ය මන්ත්‍රණ සභා සාමාජිකයන්ගෙන් සමන්විත විය.

B- සුළු ජාතිකයන්ට ද විධායක කටයුතුවලට සම්බන්ධ වීමේ ඉඩකඩ විවර කරන ලදී.

C- පුර්ණ විධායක බලතල භුක්ති විඳින ලදී.

D- ලාංකික නායකයින්ට විධායක කටයුතු කෙරෙහි පුහුණුවක් ලබා ගැනීමට හැකිවිය.

E- කැබිනට් ආණ්ඩුක්‍රමවල දැකිය හැකි සාමුහික වගකීමේ මුලධර්මය මත පදනම් වී තිබුණි.

1) A හා B ය. 2) B හා C ය. 3) A හා D ය. 4) B හා E ය. 5) A B හා D ය. (............)

24 1947 දි හඳුන්වා දෙන ලද සෝල්බරි ව්‍යවස්ථාවට අදාළවන්නේ,

A- ප්‍රථම වතාවට වෙස්ට්මිනිස්ටර් ආණ්ඩුක්‍රම ආකෘතිය ලංකාවට හඳුන්වා දෙන ලදී.

B- ලංකාව වෙනුවෙන් විජිත කාරකය හඳුන්වා දෙන ලද අවසාන ව්‍යවස්ථාව විය.

C- 1944 ඇමති මණ්ඩල කෙටුම්පතේ සහ සෝල්බරි කොමිසමේ යෝජනා මත සකස් කර ඇත.

D- සත්‍ය විධායක බලතල දරනු ලැබුවේ අගමැති සහ කැබිනට් මණ්ඩලය විසිනි.

E- අගමැතිවරයා ව්‍යවස්ථාදායකයෙන් පරිබාහිරව පත්කර ගන්නා ලදී.

1) A හා B ය. 2) B හා C ය. 3) C හා D ය. 4) A B C හා D ය. 5) B C D හා E ය. (............)

25 සෝල්බරි ව්‍යවස්ථාදායකයට අදාළ වන්නේ,

A- ඡන්දයෙන් පමණක් තෝරා ගත් මන්ත්‍රීන්ගෙන් සමන්විත විය.

B- නීති සම්පාදන බලය කිසිම විධිවිධානයකින් සීමා නොවීය.

C- ඒක මාණ්ඩලිකවාදය මත පදනම් විය.

D- අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ඉවත් කිරීමේ බලය හිමි විය.

E- මුල්‍ය පාලන බලය හිමි ආයතනය විය.

1) A හා B ය. 2) B හා C ය. 3) B හා D ය. 4) D හා E ය. 5) AB D හා E ය. (............)

- අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) (2) (3) (4) සහ (5) යන වරණ වලින් කවර වරණය දැ'යි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | ප්‍රකාශය 1 | ප්‍රකාශය 11 |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍යය වන අතර පළමු ප්‍රකාශක තවදුරටත් පැහැදිළි කරයි. |

| අංකය | ප්‍රකාශය 1 | ප්‍රකාශය 11 |
|---|---|---|
| 26 | ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක ඇති ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මහජන පරමාධිපත්‍ය යයි. | රාජ්‍ය බලයේ මූලාශ්‍රය ජනතාව වන බව මහජන පරමාධිපත්‍යයෙන් ප්‍රකාශ වේ. (........) |
| 27 | පාලකයාට හා පාලිතයාට නීතිය එක හා සමාන වන බව නීතියේ ආධිපත්‍යය තුළින් කියවේ. | සංවරණ හා තුලන මූලධර්මය අනුගමනය කරමින් විධායකයේ අන්තනෝමතිකභාවය පාලනය කළ හැකි බව පවසයි. (........) |
| 28 | ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමය පෙඩරල් ආණ්ඩු ක්‍රමයකි. | ඇමරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අලිඛිත නම්‍ය ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් සේ සලකයි. (........) |
| 29 | ඉන්දියානු පෙඩරල් ක්‍රමය තුළ ශක්තිමත් ප්‍රාන්ත ආණ්ඩු ක්‍රමයක් පවතී. | ඉන්දියානු ආණ්ඩු ක්‍රමය හදිසි අවස්ථා බලතල යටතේ ඒකීය රාජ්‍යයක් ලෙස ක්‍රියා කරයි. (........) |
| 30 | බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිඛිත හා අනම්‍ය වීමයි. | බ්‍රිතාන්‍යයේ වේල්ස්, ස්කොට්ලන්ත හා උතුරු අයර්ලන්ත යන ප්‍රාන්තවලට බලය බෙදා හැර ඇත. (........) |

## B කොටස

31 න්‍යායාත්මකව දේශපාලනය භාවිතයේ දී ප්‍රධාන තේමා දෙකක් යටතේ හඳුනා ගනී. ඒවා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

32 දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය පැතිකඩ දෙකකි. ඒවා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

33 ඔබ හඳුනාගත් දේශපාලන ආයතන දෙකක් නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

34 පහත සඳහන් චින්තකයින් රචනා කරන ලද ග්‍රන්ථ එක බැගින් නම් කරන්න.

1 ප්ලේටෝ . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2 නිකොලොයි මැකියාවලි . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

35 තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ප්‍රධාන ධාරා දෙකක් නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

36 රාජ්‍යය හා පුරවැසියා අතර සම්බන්ධයේ දී කැපී පෙනෙන ලක්ෂණ දෙකක් දක්නට ලැබේ. ඒවා නම් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

37 සමාජ ගිවිසුම්වාදය ගොඩනැගී තිබෙන්නේ ප්‍රධාන සමාජ ක්‍රම දෙකක් මතය එම සමාජ ක්‍රම දෙක නම් කරන්න

1. ..................................................................................

2 ..................................................................................

38 දේශපාලන හා සමාජ න්‍යායේ සිවිල් සමාජීය යන්නට ඇති සංකල්පය ඉතිහාසය තුළ එය අර්ථ හතරක් භාවිත කරනු දැකිය හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

39 දේශපාලන මතවාද දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

40 දේශපාලන පක්ෂ ක්‍රම දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

41 ප්‍රථමයෙන්ම බිහි වූ ජාතික රාජ්‍යයන් දෙක නම් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

42 ග්‍රීක නාගරික රාජ්‍යයේ සුවිශේෂී ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

43 ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. ..................................................................................

2 ..................................................................................

44 ගැටුම්වල ජීවන චක්‍රයේ අවස්ථා දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

45 යටත් විජිත බිහි වූ ආකාර දෙකක් හඳුනා ගත හැකිය ඒවා නම් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

46 යටත් විජිත පාලන සමයේ සිදු වූ දේශපාලන ප්‍රතිඵල දෙකක් සඨහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

47 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින් නිර්දේශ කරනු ලැබූ යෝජනාවන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

48 සෝල්බරි පාර්ලිමේන්තුව සකස් වුයේ ප්‍රධාන ආයතන තුනක එකතුවෙනි. ඉන් දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

49 සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් යොදා තිබූ විධිවිධාන දෙකක් සඳහන් කරන්න.

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

50 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී අංග දෙකක් ලියා දක්වන්න

1. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . . .

2 . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .. . . . .

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 13 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 13, Second Term Test, March 2020**

**දේශපාලන විද්‍යාව II**

**Political science II**

පැය 03

**Time:03 hours**

**සැලකිය යුතුයි**

- **මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය.**
- **පළමුවැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද,දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද,තුන්වැනි කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

## 1 කොටස

01 "දේශපාලනය යනු ආණ්ඩුකරණ ක්‍රියාවලියක් හා සමාජ භාවිතයකි. විභාග කරන්න . (ලකුණු 20)

02 දේශපාලනය හැදෑරීම සහ දේශපාලනය කිරීම පැහැදිළි කරන්න. (ලකුණු 20)

03 ජනාධිපති ආණ්ඩු ක්‍රමයේ වාසි අවාසි සාකච්ඡා කරන්න. (ලකුණු 20)

## 11 කොටස

04 ශ්‍රී ලංකාවේ සිදු වූ යටත් විජිත පරිවර්ථනයේ ආර්ථික හා දේශපාලන ප්‍රතිඵල සැකෙවින් විස්තර කරන්න.

(ලකුණු 20)

05 1931 ඩොනමෝර් සහ 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඇසුරින් පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව විමසන්න. (ලකුණු 20)

- i ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා
- ii සර්වජන ඡන්ද බලය
- iii විධායක කාරක සභා ක්‍රමය
- iv අග්‍රාණ්ඩුකාරවරයා සතු බලතල සහ කාර්යයන්
- v සෙනෙට් සභාව

06 1947 ව්‍යවස්ථාදායකය හා 1972 ව්‍යවස්ථාදායකය සතු බලතල සහ කාර්යයන් සංසන්දනය කරන්න. (ලකුණු 20)

07 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව සාකච්.ඡා කරන්න

i ජනාධිපතිවරයාගේ තත්ත්වය හා බලතල

ii මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය

iii පාර්ලිමේන්තුව

iv ව්‍යවස්ථාදායක සභාව

v 19 වන ව්‍යවස්ථා සංශෝධනය (ලකුණු 20)

**111 කොටස**

08 ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයක මූලික අංග ලක්ෂණ මොනවාදැ යි කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 20)

09 ඇමරිකානු ආණ්ඩු ක්‍රමයේ මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර තිබෙන සම්බන්ධය පැහැදිළි කරන්න. (ලකුණු 20)

10 පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i ස්ත්‍රීවාදය

ii රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය

iii නිරාගමිකවාදය

iv ගැටුම් නිරාකරණය

v දාර්ශනික අධ්‍යයන ප්‍රවේශය (ලකුණු 20)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේනතුව

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

දෙවන වාර පරීක්ෂණය 2020 මාර්තු

දේශපාලන විද්‍යාව I

Political science I

<u>පිළිතුරු පත්‍රය</u> **13 ශ්‍රේණිය**

| | | |
|---|---|---|
| 01 05 | 11 05 | 21 02 |
| 02 04 | 12 05 | 22 01 |
| 03 02 | 13 05 | 23 05 |
| 04 01 | 14 03 | 24 04 |
| 05 02 | 15 03 | 25 04 |
| 06 03 | 16 01 | 26 05 |
| 07 01 | 17 02 | 27 01 |
| 08 05 | 18 05 | 28 02 |
| 09 03 | 19 02 | 29 03 |
| 10 02 | 20 05 | 30 04 |

## B කොටස

31 1 රාජ්‍ය පරිපාලන හා ආණ්ඩුකරණ ක්‍රියාවලියක් ලෙස
2 සමාජ භාවිතයක් ලෙස

32 1 දේශපාලනය කිරීම
2 දේශපාලනය හැදෑරීම

33 1 රාජ්‍යය පාර්ලිමේන්තුව
ආණ්ඩුතන්ත්‍ර දේශපාලන පක්ෂ

2 නිලබල ක්‍රමය කැබිනට් මණ්ඩලය
අධිකරණය පළාත් පාලන සභා

34 1 සමූහාණ්ඩුව (ජනරජය)
2 කුමාරයා

35 1 සම්භාව්‍ය තුළනාත්මක දේශපාලන අධ්‍යයන ප්‍රවේශය
2 විසිවැනි සියවසේ තුළනාත්මක දේශපාලන අධ්‍යයනය
සමකාලීන තුළනාත්මක දේශපාලන අධ්‍යයනය

36 1 පුරවැසියන් භුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම්
2 පුරවැසියන්ගේ දේශපාලන වගකීම්

37 1 ප්‍රකෘති සමාජය (ස්වාභාවික සමාජය)
2 සිවිල් සමාජය

38 1 සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය
සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය
2 සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය
නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය

39 1 ලිබරල් වාදය
සමාජ වාදය
2 සමූහාණ්ඩු වාදය
සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

40 1 අධිපති තනි පක්ෂ ක්‍රම
අධිපති ද්වි පක්ෂ ක්‍රම
2 බහු පක්ෂ ක්‍රම
ද්වි පක්ෂ ක්‍රම
තනි පක්ෂ ක්‍රම

41 1 ප්‍රංශය
2 එංගලන්තය

42 1 ඍජු ප්‍රජාතන්ත්‍රවාදය
ස්ත්‍රීන්ට, ළමුන්ට, වහලුන්ට දේශපාලන බලය අහිමි වීම
2 දේශපාලන බලය හිමි වූයේ රදළයින්ට, වහල් හිමියන්ට සහ නිදහස් වැසියන්ට පමණි.

43 1 නූතනවාදී ප්‍රවේශය
චිරන්තනවාදී ප්‍රවේශය
2 මෙවළම්වාදී ප්‍රවේශය

44 1 ගැටුම් පැන නැගීම
උත්සන්න වීම
2 සාම සාකච්ඡා
ගැටුම් කෙළවර වීම

45 1 කිසියම් රාජ්‍යයක ජනතාව නව දේශයක් සොයාගෙන එය ජනාවාස කර මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත්ව නව දේශය පවත්වා ගැනීම
2 බලගතු රාජ්‍යයක් විසින් පෙර ජනාවාස වූ ප්‍රදේශයක් ගිවිසුමකින් හෝ යුධ බලයෙන් හෝ ඇඳා ගෙන තම ආධිපත්‍යය යටතේ පාලනය කිරීම

46 1 විධායක හා ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම
2 ආණ්ඩුකරුගේ බලතල කප්පාදු කිරීම

47 1 සර්වජන ඡන්ද බලය
2 වාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

48 1 අග්‍රාණ්ඩුකාරවරයා
2 මහජන මන්ත්‍රී මණ්ඩලය
සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය

49 1 291 වගන්තිය
අධිකරණ හා රාජ්‍ය සේවා කොමිසම
2 බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ පිහිටු වීම

50 1 මහජන ඡන්දයෙන් පත් කරන ව්‍යවස්ථාදායකය
නිතිපතා පැවැත්වෙන මැතිවරණ
2 සාපේක්ෂ වශයෙන් ස්වාධීන අධිකරණය
බලය විමධ්‍යගත කිරීම



LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440